# වනාන්තරහරණය සහ දේශපාලනික පසුබිම: විල්පත්තුව වනෝද්‍යානය අවට ප්‍රේරිත කලාප ඇසුරින්

යූ.පී.එම්.සී.අමරාණි - දේශපාලනවිද්‍යාව සහ රාජ්‍ය ප්‍රතිපත්ති අධ්‍යයනාංශය

ඉහත දැක්වූ මාතෘකාව යටතේ පර්යේෂණ නිබන්ධනය සකස් කිරීමේ දී මා විසින් අධ්‍යයනය කරනු ලැබූවේ විල්පත්තුව වනෝද්‍යානය අවට ප්‍රේරිත කලාපවල නැවත පදිංචි කරවීමේ මුවාවෙන් දේශපාලනඥයන් තම අනන්‍යතා ගොඩනගාගැනීමට කටයුතු කර ඇත්තේ කෙසේද? යන්න පිළිබඳවයි. මෙවැනි ගැටලුවක් තෝරා ගැනීමට මා පොළඹවූයේ පසුගිය වසර මැද භාගය වන විට දී සමාජ මාධ්‍ය ඔස්සේ ප්‍රචාරණය කරනු ලැබූ විල්පත්තුව අවට සිදුව ඇති විනාශය පිළිබඳව කතිකාවය. එහි මුඛ්‍ය පරමාර්ථ වූයේ උක්ත වන විනාශයට තුඩු දුන් නැවත පදිංචිකිරීම් සිදුව ඇත්තේ වනාන්තර ප්‍රදේශය තුළද යන්න සෙවීම සහ මෙම වන විනාශයෙහි අවසානයක් දක්නට නොලැබීමට හේතුකවරේද යන්න සෙවීමය. මෙහි දී මිශ්‍ර විධික්‍රමයක් යොදාගනු ලැබීය. ප්‍රාථමික දත්ත ලෙස පුවත්පත්, විල්පත්තු වනාන්තරහරණය පිළිබඳව විශ්ලේෂණ වාර්තාව ආදිය යොදාගනු ලැබූ අතර ද්විතියික දත්ත ලෙස සම්මුඛ සාකච්ඡා සිදුකර තොරතුරු ලබාගනු ලැබීය. මේ ගුණාත්මක ක්‍රමවේදයක් යොදාගනු ලැබූවේ ප්‍රමාණාත්මක කරුණු මත පදනම් වෙමින් පර්යේෂණ අරමුණු සාර්ථකව ඉටුකරගැනීමට නොහැකි බැවිනි. අධ්‍යයනයෙන් සොයාගනු ලැබූ කරුණු කිහිපයක් විය. වනාන්තරහරණය සිදුව ඇත්තේ විල්පත්තු ජාතික වනෝද්‍යානය තුළ නොවන අතරම එහි ප්‍රේරිත කලාප වන මරිච්චුකඩ්ඩි, කල්ලාරු, කොණ්ඩච්චි යන ප්‍රදේශ තුළ බවය. මෙම ප්‍රදේශවල නැවත පදිංචිකිරීම් සිදුකිරීමේ දී ප්‍රමුඛස්ථානයක් ලබා දී ඇත්තේ මුස්ලිම් ජනතාවට වන අතර එම කටයුතුවල දී ප්‍රධානත්වයක් ගෙන තිබෙන්නේ මුස්ලිම් දේශපාලනඥයෙක් බව ද පෙනුණි. තවද, උක්ත ප්‍රදේශවල නැවත පදිංචිකිරීම් සිදුවී ඇත්තේ යුද්ධයට මෙම ප්‍රදේශවල සිටි ජනතාව පමණක් නොවන අතරම එහිදී ඉහළ ප්‍රතිශතයක් ගෙන ඇත්තේ දේශපාලන හිතවත්කම මත සිදු කරනු ලැබූ පදිංචිකිරීම් බවද අනාවරණය විය. මෙහි තර්කය වන්නේ සුභසාධන රාජ්‍ය ක්‍රමය තුළ සිදු කෙරෙන සංවර්ධන ව්‍යාපෘතිවල දී අනුග්‍රාහක - සේවාදායක සම්බන්ධතාව මත දේශපාලනඥයන් තම වරප්‍රසාද වෙනුවෙන් කටයුතු කරන බවයි.

***ප්‍රමුඛ පද:*** *වනාන්තරහරණය, මැතිවරණ දේශපාලනය, සංවර්ධන ව්‍යාපෘති අනුග්‍රාහක සේවාදායක සම්බන්ධතාව, නැවත පදිංචි කිරීම්*